# වගා ළිං ජල හිඟය සහ වියළි කලාපීය ගොවියා

*එච්. එම්. ජේ. කේ. හේරත්*
පර්යේෂණ හා පුහුණුකිරීමේ නිලධාරී ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය

**1988 න් පසුව ලැබුණු රාජ්‍ය අනුග්‍රහය යටතේ මූලික වශයෙන් වියළි කලාපයේ පවතින ජල හිඟයට පිළියමක් ලෙස කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය මගින් ජාතික මට්ටමෙන් දියත් කළ ව්‍යාපෘතියක් ලෙස කෘෂි කාර්මික ළිං ඉදිකිරීමේ ව්‍යාපෘතිය හඳුන්වා දිය හැකිය. වර්තමානයේ එය පියවර කිහිපයක් යටතේ වියළි කලාපය පුරාම ව්‍යාප්ත කිරීමට කටයුතු සළසා ඇත. කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය විසින් රාජ්‍ය බැංකුවල සම්පූර්ණ සහයෝගය ඇතිව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබයි. මෙය පළාත් මට්ටමෙන්, දිස්ත්‍රික් මට්ටමෙන් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමෙන් ක්‍රියාත්මක වේ.**

මෙයට අවුරුදු බොහෝ ගණනකට පෙර සිටම යාපනය අර්ධද්වීපයෙහි වූ ජල හිඟයට පිළියමක් ලෙස ගොවීන් විසින් ආඩියා ළිං ඉදිකරන ලදී. එම ආඩියා ළිං උපයෝගී කර ගනිමින් එම ප්‍රදේශවල විවිධ බෝග වර්ග වගා කරන ලදී. බෝග වගා කිරීම පමණක් නොව යාපනය අර්ධද්වීපයේ මිනිසුන් බීමට ජලය ලබාගනු ලැබුවේ ද මෙම ළිං මගිනි. යාපනය අර්ධද්වීපයේ ජනතාවට ජලය සපයා දුන් ප්‍රධාන මාර්ගය ලෙස මෙම ආඩියා ළිං හැඳින්විය හැක. වර්තමානයේ ක්‍රියාත්මක වන වගා ළිං හෙවත් කෘෂිකාර්මික ළිං මේ හා සමානව වියළි කලාපීය ජනතාවට ජල සැපයීමේ එක් මූලික මාධ්‍යයක් ලෙස හඳුන්වා දිය හැකිය.

මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ දී දිස්ත්‍රික් කමිටුව සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ කමිටුවට එකිනෙකට වෙන් වූ වගකීම් කාර්යභාරයන් කිහිපයක් වේ. දිස්ත්‍රික් කමිටුවේ කාර්යභාරය සහ වගකීම වන්නේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ක්‍රියාත්මක කරනු ලබන කෘෂි ළිං පිළිබඳව අධීක්ෂණය කිරීමයි.

**ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ කමිටුව සතු වගකීම් සහ කාර්යභාරයන් ලෙස**

* ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා වැඩසටහනක් පිළියෙල කිරීම
* ගොවීන් තෝරා නිර්දේශ කිරීම
* සහනාධාර කොටස් ලෙස ගෙවීමට නිර්දේශ කිරීම
* සහනාධාර යෙදවීම සොයා බැලීම
* ණය යෙදවීම සොයා බැලීම
* වගා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සොයා බැලීම
* කෘෂිකාර්මික යෙදවුම් සැපයීම සොයා බැලීම
* ණය ආපසු ගෙවීම සොයා බැලීම
* අලෙවි කටයුතු සම්බන්ධීකරණය කිරීම
* ගොවීන් සඳහා පුහුණු පංති, සම්බන්ධීකරණ කටයුතු සහ මෙම ව්‍යාපෘති නිසි පරිදි ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වෙනත් කටයුතු කිරීම

වගා ළිඳක් ලබාදීම සඳහා ඉල්ලුම්කරුවකු තෝරා ගැනීමේ දී ඒ සඳහා සළකා බලනු ලබන කරුණු කිහිපයක් ද වේ.

* ඉල්ලුම්කරු ව්‍යාපෘති ප්‍රදේශයේ ස්ථිර පදිංචි කරුවකු විය යුතුය.
* වයස අවුරුදු 55 ට අඩු විය යුතුය
* ඉල්ලුම්කරු සතුව බැංකු ගිණුමක් (ඉතිරි කිරීමේ ගිණුමක් සෑහේ) තිබිය යුතුය
* වලංගු ගොවි හැඳුනුම්පතක් තිබිය යුතුය
* ව්‍යාපෘති ප්‍රදේශයේ නොදියුණු අක්කර 01 ට හෝ ඊට වැඩි ප්‍රමාණයක ඉඩමක අයිතියක් ඉල්ලුම්කරු සතු විය යුතුය.
* කෘෂි රක්ෂණ මණ්ඩලය මගින් ක්‍රියාත්මක ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ප්‍රතිලාභ අයිතියක් ඉල්ලුම්කරු සතු විය යුතුය.
* මෙම ළිඳ හෝ වෙනත් වගා කටයුතු සඳහා හෝ ලබාගත් ණය ගෙවීමේ හැකියාව ද ඉල්ලුම්කරුට තිබිය යුතුය.
* එක් ගොවියෙකු හෝ කිහිප දෙනෙකුගෙන් යුතු පවුල් ඒකකයකට වගා ළිඳක් සඳහා පමණක් ණය මුදලක් ලබාගැනීමේ හිමිකම ඇත.

වගා ළිං ඉදිකිරීමේ දී ඉල්ලුම්කරු ඔවුන්ගේ ඉඩමේ පහත් ස්ථානයක් ළිඳ සඳහා තෝරාගත යුතුය. මෙම ළිං දෙකක් අතර අවම දුර ප්‍රමාණය අඩි 300 ක් විය යුතුය. ප්‍රධාන ළිඳ සකස් කිරීමට ප්‍රථම පරීක්ෂණ ළිඳක් ඉදිකරනු ලබන අතර පසුව ප්‍රධාන ළිඳ ඉදිකරයි.

ප්‍රධාන ළිඳෙහි මුළු ගැඹුර අවම වශයෙන් අඩි 15 ක් වත් විය යුතු අතර එහි විෂ්කම්භය අඩි 17 ක් විය යුතුය. ජලය තිබෙන ආකාරය අනුව ළිඳෙහි ගැඹුර ඊට වඩා වැඩි විය හැකිය.

මෙම ව්‍යාපෘතියෙන් පසුව ණය ලාභියාට ලැබෙන ආදායම හා ඔහුගේ හැකියාව මත තුන්මසක සහන කාලයකට යටත්ව ණය ගෙවිය යුතුය. ණය ආපසු ගෙවීමේ උපරිම කාල සීමාව මාස 06 කි.

කෘෂි ළිං ව්‍යාපෘතියෙහි තුන්වන අදියර 1992 වසරෙහි ආරම්භ කරනු ලැබීය. මෙහිදී තැනීමට අපේක්ෂිත වූ ළිං සංඛ්‍යාව 5000 කි. ඒ සඳහා රුපියල් මිලියන 105 ක් වැයවේ යයි ගණන් බලා ඇත.

| | |
|---|---|
| කුරුණෑගල දිස්ත්‍රික්කය සඳහා ළිං | 625 |
| පුත්තලම " " " | 257 |
| රත්නපුර " " " | 135 |
| අම්පාර " " " | 200 |
| හම්බන්තොට " " " | 100 |
| මාතලේ " " " | 400 |
| මහනුවර " " " | 50 |
| බදුල්ල " " " | 310 |

| | |
|---|---|
| මොණරාගල | 765 |
| මාතර | 60 |
| පොළොන්නරුව | 360 |
| අනුරාධපුර | 1005 |
| වව්නියාව | 45 |
| ත්‍රිකුණාමලය | 65 |
| මඩකලපුව | 45 |

ඉහත සංඛ්‍යා සටහන පදනම් කරගෙන එයට අනුව ලංකාවේ දිස්ත්‍රික්ක 15 ක් සඳහා 92 වසරෙහි තුන්වන අදියර ලෙස මෙය නම්කර තිබේ. මෙහිදී විශේෂයෙන් සඳහන් කළ යුත්තේ අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ වැඩිම වගා ළිං ප්‍රමාණයක් (1005) ඉදිකිරීමට සැළසුම් කර තිබෙන බවයි.

අනුරාධපුර දිස්ත්‍රික්කයේ හොරොව්පතාන සහ කැකිරාව යන මැතිවරණ කොට්ඨාශයන් තුළ පිහිටුවා ඇති කෘෂි ළිං පිළිබඳව මෑතක සොයා බැලීමක් කරන ලදී. එම අවස්ථාව වන විට හොරොව්පතාන කොට්ඨාශය සඳහා වගා ළිං 320 ක් ද, කැකිරාව සඳහා වගා ළිං 60 ක් ද ඉදිකිරීමට ඉහත ව්‍යාපෘතියෙහි ක්‍රියාත්මක වෙමින් තිබුණි. මෙම විමසුම් චාරිකාව කරන අවස්ථාව වන විට, ඇතැම් අය නිම කරන ලද කෘෂි ළිංවල ජලයෙන් වගාවන් අස්වද්දා ඒ තුළින් ආදායම ලබාගනිමින් සිටියහ. දැනට ගොඩනගමින් පවතින වගා ළිං හා දැනට යෝජිත වගා ළිං ඉදිකෙරෙන ස්ථාන ද දැකගන්නට ලැබුණි.

මෙම ප්‍රදේශය තුළ කෘෂිකාර්මික අධිකාරියට අමතරව වෙනත් රාජ්‍ය නොවන ආයතනවල සහයෝගයෙන් ද කෘෂිකාර්මික ළිං ඉදිකිරීමට යෝජනා කර ඇති බවත් එහිදී අපට දැනගන්නට ලැබුණි.

මෙම වගා ළිං ඉදිකිරීම සඳහා අවශ්‍ය මුදල් වලින් කොටසක් කෘෂි සංවර්ධන අධිකාරිය ඒසින් ගොවීන්ට ලබාදෙයි. ඉතිරි කොටස ගොවීන්ගේ දායකත්වය වේ. මෙම ප්‍රදේශය තුළ කෘෂිකාර්මික සංවර්ධන අධිකාරියෙන් යෝජිත ළිං ඉදිකිරීමේ ව්‍යාපෘතියට අමතරව රාජ්‍ය නොවන සංවිධානයක් වන සර්වෝදය ව්‍යාපාරයෙන් ද කෘෂිකාර්මික ළිං ඉදිකිරීමේ යෝජිත යෝජනා ක්‍රමයක් තිබෙන බව එම ප්‍රදේශයේ ගොවීන්ගෙන් දැන ගන්නට ලැබුණි.

ගොවීන්ගේ දායකත්වය ඇති කිරීමේ පරමාර්ථය වනුයේ තමාගේ අයිතිය පිළිබඳ හැඟීමක් ඔවුන්ගේ සිත් තුළ ඇති කරවීමයි. වගා ළිඳ ඉදිකර අවසාන වනවිට රු: 39,000 ක් 50,000 ක් අතර මුදල් ප්‍රමාණයක් වැය වන බව ගොවිහු ප්‍රකාශ කළහ. මෙලෙස ණය මුදල් ලබා දී වගා ළිං ඉදිකර දීම ඔවුනට කරන ඉතා ප්‍රයෝජනවත් වැඩ පිළිවෙලක් ලෙස ඔවුන් පැවසූහ.

අප වගා ළිං පිළිබඳව කළ නිරීක්ෂන චාරිකාවේ දී කැකිරාව කොට්ඨාශයේ ඔලුගස්කඩ ප්‍රදේශයේ ගොවි මහත්වරුන් කිහිපදෙනෙකු හමුවූ අතර ඔවුන් මේ පිළිබඳව විවිධ අදහස් ඉදිරිපත් කළහ. එම ප්‍රදේශයේ වගා ළිඳක හිමිකරුවකු වන එස්. එම්. රත්නායක මහතා ඔහුගේ අදහස් මෙලෙස ඉදිරිපත් කළේය.

මේ වගා ළිං හදන්න පටන් ගන්නට කලින් අපිට වගා කරන්න ජලය තිබුණේ නෑ. ඒ නිසා අපිට ජලය තිබෙන තැන්වලට ඉඩම් හෙයාගෙන යන්න සිද්ධ වුණා. ජල පහසුකම් තිබෙන වගා ඉඩම් හිමියන්ගෙන් ඒ ඉඩම් බද්දු අරගෙන වැටවල් දමා කාණු හා පාත්ති සකස් කර වගා කටයුතු කරනවා. එසේ වගාකරන ඉඩම, ඉඩම් හිමියන් විසින් අපට දෙන්නේ එක කන්නයක් සඳහා පමණයි. ඒකට හේතුව අප ඉඩම සකස් කිරීම නිසා ඉඩමේ වටිනාකම වැඩි වෙනවා. එනිසා ඉඩම් හිමියන්ට එම ඉඩම් නැවත වැඩිමිලට බද්දු දෙන්න පුළුවන්. ඒ නිසා අපට නැවතත් ජලය පහසුවෙන් ලබාගත හැකි, ඉඩමක් බද්දු ගැනීමට සිදුවෙනවා. මෙයින් මුදල් මෙන්ම කාලය ද අපේ නාස්ති වෙනවා. නමුත් මෙම වගා ළිං නිසා අපට අපේම ඉඩම් අපට අවශ්‍ය ආකාරයට සංවර්ධනය කරගැනීමට හැකි වෙනවා.

මෙම චාරිකාවේ දී අපට කැකිරාව ඇල්ලව ප්‍රදේශයේ දී හමු වූ තවත් තරුණ ගොවි මහතෙකු වූ ආර්. ඩබ්. විජේසිංහ මහතා තමන් විසින් ඉදිකරගත් වගා ළිඳ පිළිබඳව ඔහුගේ අදහස් මෙසේ දැක්වීය. මට මෙම වගා ළිඳ ඉදිකර ගැනීමට ලැබුණේ 1990 මුලදීයි. මෙම වගා ළිඳ ඉදිකිරීමට ප්‍රථම කිසිම යල කන්නයක මම ගොවිතැන් කළේ නැහැ. නමුත් මම මෙය ඉදිකිරීමෙන් පසුව දැන් මම යල කන්නයේදීත් ගොවිතැන් කටයුතු කරනවා. මම හැම යල කන්නයකම වාගේ කෘෂි ළිඳ උපයෝගී කරගෙන අක්කර 1 - 11/2 පමණ ගොඩ ගොවිතැන් කරනවා. ඒ මගින් මම රු:50,000/- 70,000/- ක් පමණ ආදායමක් උපයා ගන්නවා. මෙතෙක් මම වැඩිපුරම වගා කළේ ලොකු ළූණු, මිරිස් සහ එළවළුයි. ඒ වගේම මෙම වගා ළිඳ අකල් නියං කාලවලදී අපට ජලය ලබාගත හැකි ප්‍රධානතම මාර්ගය වුණා.

ඉන්පසුව අපි හමු වූයේ හොරොව්පතාන මොරවැව ප්‍රදේශයේ ආර්. එම්. රණසිංහ නැමැති ගොවි මහතෙකි. ඔහු සමග මේ සම්බන්ධව කරන ලද පිළිසඳර පහත දැක්වේ. මට කෘෂි ළිඳක් ඉදිකර ගැනීමට 1989 දී අවස්ථාව ලැබුණා. එහි ජලයෙන් මම දැන් වගා කටයුතු කරගෙන යනවා. මට අක්කර භාගයක පමණ කුඹුරක් තියෙනවා. අක්කරයක පමණ ගොඩ ඉඩමකුත් තියෙනවා. මම යල කන්නයේ දී කෘෂි ළිඳේ ජලයෙන් මෙම අක්කර 1/2 කුඹුර වැඩ කරනවා. වගා ළිඳ ඉදිකිරීමට ප්‍රථම කිසිම යල කන්නයකදී මට මෙම කුඹුර අස්වද්දන්නට ජලය තිබුණේ නැහැ.

මෙම වගා ළිඳ මගේ ඉඩමේ හැදුවට පස්සේ මගේ ඉඩමේ වටිනාකමත් රු. ලක්ෂයකින් විතර ඉහළ ගියා. මේ වගා ළිඳ ඉදිකරන්නත් රු: 30,000 - 50,000 ක් අතර මුදලක් වැය වෙනවා. එය ඉඩමේ වටිනාකමට එකතු වෙන නිසාත් ඉඩම දැන් ජල පහසුකම් තිබෙන නිසාත් ඉඩම පෙරට වඩා දැන් හුඟක් වටිනවා.

ඉන් පසුව හමුවූයේ හොරොව්පතාන මොරවැව ප්‍රදේශයේ ගොවි මහතෙකු වූ විජේරත්නයි. මට මේ කෘෂි ළිඳ ඉදිකරගන්න ලැබුණේ 1991 දීය. මෙම ප්‍රදේශයේ ප්‍රථම වරට මම තමයි ගොටුකොළ වගා කිරීම ආරම්භ කළේ. එම ගොටුකොළ වගාවට අක්කරයක් විතර යට කළා. එයට ජලය ලබාගත්තේ මෙම කෘෂි ළිඳෙන්. ඉතිරි කොටස අක්කරයක පමණ කෙසෙල් ගස් සහ දෙහි දොඩම් වගා කළා. දිනකට ගොටුකොළ මිටි 100 - 150 ක් පමණ වෙළඳ පොළට යවනවා. මට දිනකට රුපියල් 150 - 200 ක් පමණ ආදායමක් ලබාගන්න පුළුවන්.

වගා ළිඳ නිසා මට හොඳ පාරිභෝගික ඉල්ලුමක් තියෙන බෝග වගී වගා කරන්න පුළුවන් වුණා. නමුත් මහා පරිමාණ හෝ සුළු පරිමාන වාරික්‍රම යටතේ අපට එසේ කිරීමට බෑ. එහෙම වෙන්නේ වාරි ක්‍රම වලදී වගා කරන බෝග වගී තීරණය කරන්නේ වෙනත් අය නිසාත් ඒ වගේම එහිදී ජල පාලනය කරන නිසාත් කියල තමයි මගේ නම් හැඟීම.

මට වගා ළිඳ ආශ්‍රයෙන් බෝග වගාකිරීම පිළිබඳව මහඉලුප්පල්ලමේ කෘෂි පර්යේෂන මධ්‍යස්ථානයේ දී පුහුණුවක් ලබා දුන්නා. ඇත්තටම ඒ පුහුනුව ඉතාම වැදගත් මට වගාකටයුතු කරගෙන යාමේදී මෙම පුහුණුව ඉතාමත් ප්‍රයෝජනවත් වුණා. මෙවැනි පුහුනු වැඩසටහන් සංවිධානය කරනවා නම් එය ඉතාම හොඳයි.

මෙතෙක් මේ පිළිසඳර මගින් මා සඳහන් කළේ ගොවි මහත්වරු මේ පිළිබඳව දරණ අදහස්වලින් බිඳකි. ඔවුහු මේ හා සම්බන්ධයෙන් දකින්නේ එහි සුභවාදී පැත්ත පමණක් බව පෙනෙයි.

එහෙත් කෘෂි ළිං භාවිතයට පත් කිරීමේ දී දැනට, හොඳ ප්‍රතිඵල පෙනෙන්නට ඇතත්, එහි අනාගතයත් එවැනිම වූ හොඳ ප්‍රතිඵල වලින් සමන්විත වේයැ'යි සිතීම නුවනට හුරුද යන්න ප්‍රශ්ණයකි.